# පර්යේෂණ වාර්තාවක් සකස් කිරීම

-මුවපැටිගේවෙල හේමාලෝක හිමි

**ප්‍රවේශය**

වාර්තාවක් යනු සුවිශේෂී පිරිසක් සඳහා සුවිශේෂී අරමුණකින් සංවිධානාත්මක ආකාරයෙන් තොරතුරු ඉදිරිපත් කරනු ලබන කිසියම් ලේඛනයකි. කිසියම් වාර්තාවක සංක්ෂේපය වාචිකව ඉදිරිපත් කරනු ලැබුව ද සම්පූර්ණ වාර්තාවක් ලේඛනයක් විය යුතුය (Wikireport n.d). පර්යේෂණ වාර්තාවක් යනු ඕනෑම පර්යේෂණයක ප්‍රතිඵල පිළිබඳව මනා පාලනයකින් සහ විධිමත්ව ප්‍රකාශයට පත් කරනු ලබන ලේඛනයකි. කිසියම් ක්‍රමවත් ගවේෂණයක අවසාන ප්‍රතිඵලය නැතහොත් නිමැවුම පර්යේෂණ වාර්තාවකි (chimoriya, 2017). එය බොහෝ විට ඉදිරිපත් කරනු ලබන්නේ කිසියම් විශ්වාස කටයුතු මණ්ඩලයකට හෝ පර්යේෂණය සඳහා මූල්‍ය ආධාර පිරිනමනු ලබන ආයතනයකටය. සාමාන්‍යයෙන් පර්යේෂණයක් යෝජනාව සකස් කිරීම, ක්‍රියාපටිපාටිය, විශ්ලේෂණය හා ප්‍රතිඵල ඉදිරිපත් කිරීම ආදී පියවර රාශියකින් යුක්ත වේ. එහි අවසාන පියවර වන්නේ පර්යේෂණ වාර්තාවක් සකස් කිරීමයි. එය පර්යේෂණයක ප්‍රතිඵල පිළිබඳව විද්‍යාත්මක සහ වෘත්තීය සන්නිවේදන ක්‍රියාවලියකි. පර්යේෂණ වාර්තාවක සාමාන්‍ය අරමුණ වන්නේ පර්යේෂණ කාර්යයක ප්‍රමාණවත් තොරතුරු රැගෙන යෑමයි.

පර්යේෂණ වාර්තාවක් යනු පර්යේෂණය පිළිබඳ සමස්ත ප්‍රකාශනයක් වන බැවින් ඕනෑම පර්යේෂණ වාර්තාවක් මගින් එම පර්යේෂණයේ අරමුණු (සිදු කරන්නේ කුමක් සඳහාද), සිදු කළ ආකාරය සහ ප්‍රතිඵල ගම්‍ය විය යුතුය. ක්‍රිෂ්ණ සාමිට අනුව පර්යේෂණ වාර්තාවක් යනු පර්යේෂණ ක්‍රියාවලිය සහ එහි ප්‍රතිඵලය පිළිබඳව විධිමත් ප්‍රකාශනයකි (Krishnaswami, Ranganatham, Harikumar, 2016: 398). න්‍යූමන් (Neuman) පෙන්වා දෙන පරිදි පර්යේෂණ වාර්තාවක් යනු පර්යේෂණ යෝජනාවක ක්‍රමවේද සහ ප්‍රතිඵල පිළිබඳව අන්‍යයන්ට සන්නිවේදනය කරනු ලබන ලියවිල්ලකි (Neuman, 2014:515). ඵලදායී පර්යේෂණ

වාර්තාවක් ලිවීම එක්තරා ආකාරයක කලාවකි. එබැවින් ශ්‍රී ලාංකේය පර්යේෂකයෙකු වූ විජේරත්න (1996) දී පර්යේෂණ වාර්තාවක් පිළිබඳව මෙබඳු නිර්වචනයක් ඉදිරිපත් කරයි.

> ''පර්යේෂණ ප්‍රතිඵල මැනවින් වාර්තා කිරීම පර්යේෂකයාට මෙන්ම වාර්තාව කියවන්නාට ද පර්යේෂණය අර්ථවත් කරගැනීමට උපකාරී වේ. ප්‍රතිඵල වාර්තාවකින් කියවෙන්නේ ප්‍රතිඵල පමණක්ම නොවේ. එහිදී සම්පූර්ණ පර්යේෂණ ක්‍රියාවලිය ම වාර්තා විය යුතුය.''
>
> (විජේරත්න, 1996:73)

පර්යේෂණ වාර්තාවක ප්‍රධාන අරමුණ ප්‍රතිඵල පිළිබඳව අනාවරණය කිරීම වුවද එහි සමස්ත පර්යේෂණය සිදුකළ ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් විය යුතුය. වාර්තාව අධ්‍යයනය කිරීමෙන් පාඨකයාට පර්යේෂණය පිළිබඳව පරිපූර්ණ අවබෝධයක් ලබාගත හැකිවිය යුතුය. වාර්තාවේ පර්යේෂණයට අදාළ වැදගත් තොරතුරු සියල්ලක්ම පාහේ ඇතුළත් විය යුතුය. පාඨකයා කිසියම් පර්යේෂණයක් පිළිබඳව තොරතුරු දැනගන්නේ සමස්ත පර්යේෂණය අධ්‍යනය කිරීමෙන් නොව එහි වාර්තාව කියවීමෙනි. එබැවින් වාර්තාව පර්යේෂණයේ සාරය අන්තර්ගත කැඩපතක් වැනිය. ඇතැම්හු පර්යේෂණ වාර්තාව පර්යේෂණයක සමාලෝචනයක් වශයෙන් ද සලකති. කිසියම් පර්යේෂණයකින් ලබාගත් ප්‍රතිඵල පර්යේෂණ වාර්තාවක්, පත්‍රිකාවක් හෝ පොතක් ආදී වශයෙන් ප්‍රකාශයට පත් කළ හැකිය.

පර්යේෂණ වාර්තාව පර්යේෂණයක ප්‍රධානම සහ වැදගත්ම කොටස වශයෙන් සැලකේ. ඕනෑම පර්යේෂණයක් එහි වාර්තාව ඉදිරිපත් කරන තුරු අසම්පූර්ණය. ඉතා ශක්තිමත් උපන්‍යාස ගොඩනගා මනා ලෙස සැලසුම්කොට සිදුකරන ලද සාමාන්‍යකරණය කළ හැකි ප්‍රතිඵලවලින් යුක්ත වූ පර්යේෂණයක් වුවද අන්‍යයන්ට මනා ලෙස සන්නිවේදනය නොවුවහොත් එහි වටිනාකම හීන වේ. පර්යේෂණයක ප්‍රතිඵල අනෙකා නොදැනීම තුළ පර්යේෂණය මගින් අපේක්ෂිත අරමුණු ඉටු නොවේ. පර්යේෂණ ප්‍රතිඵල නිත්‍ය වශයෙන්ම විශ්ව දැනුම් ගබඩාවට එකතු විය යුතුය (Kothari, 2004: 346).

**පර්යේෂණ වාර්තා වර්ග**

පර්යේෂණ වාර්තා ඒවායෙහි ප්‍රමාණය සහ වර්ග අනුව වෙනස් වේ. උදාහරණයක් ලෙස ව්‍යාපාර සමාගමක වාර්තාවක් පිටුවක් හෝ දෙකක තරම් ප්‍රමාණයෙන් යුත් ලිපියක් ආකාරයෙන් ඉදිරිපත් වේ. බැංකු රක්ෂණ සමාගම් සහ මූල්‍ය ආයතන ඔවුන්ගේ වාර්ෂික වාර්තා කෙටි ශේෂ පත්‍රයක වගු මගින් ගනුදෙනුකරුවන්ට හා කොටස්කරුවන්ට ඉදිරිපත් කරති. ගණිතඥයෝ ඔවුන්ගේ අධ්‍යයනවල ප්‍රතිඵල වීජීය සලකුණු මගින් වාර්තා කරති. රසායන විද්‍යාත්මක පර්යේෂණ වාර්තා සංකේත හා සූත්‍ර මගින් දක්වන අතර සාහිත්‍ය පිළිබඳව පර්යේෂණ වාර්තා ලේඛකයන් හා කිසියම් කාල වකවානු පිළිබඳව විවේචනාත්මක විශ්ලේෂණයෙන් යුක්තව ඉතා දීර්ඝ ලෙස ඉදිරිපත් කෙරේ. අධ්‍යාපනය හා මනෝවිද්‍යාව වැනි ක්ෂේත්‍රවල සම්පරීක්ෂණ ප්‍රතිඵල වාර්තා විස්තරාත්මක සංඛ්‍යාන විද්‍යාත්මක වගු මගින් වාර්තා කෙරේ. රාජ්‍ය ආයතන, විශේෂ කොමිෂන් සභා හා ඒ හා සමාන වෙනත් සංවිධාන මගින් සම්පාදනය කරනු ලබන පර්යේෂණ වාර්තා සාමාන්‍යයෙන් ඉතා විස්තරාත්මක වේ. එබඳු පර්යේෂණ වාර්තා ඉතා වැදගත් නිෂ්පාදන වශයෙන් ද සලකනු ලැබේ. විශ්වවිද්‍යාලය හා උසස් අධ්‍යාපන ආයතන වැනි ශාස්ත්‍රීය ආයතනවල සිසුන් විසින් සකස් කරනු ලබන උපාධි නිබන්ධ ද පුළුල් විස්තරාත්මක පර්යේෂණ වාර්තා වර්ගයකි. ඒ අනුව ඕනෑම උපාධි නිබන්ධයක් පර්යේෂණ වාර්තාවක් වශයෙන් සැලකිය හැකිය. පර්යේෂණ වාර්තාවක සැකැස්ම, නිර්ණායකයන් සහ ප්‍රමිතීන් උපාධි නිබන්ධය සම්පාදනය කිරීමේදී ඒ අයුරින්ම යොදාගනු ලැබේ. කෙසේ නමුත් ඇතැම් මානව ශාස්ත්‍ර විෂයයන්හි දී මෙකී නිර්ණායක වෙනස් වීමට හෝ සංශෝධනයට ලක්විය හැකිය. කිසියම් පර්යේෂණයක ප්‍රතිඵල විවිධ ක්‍රම මගින් ඉදිරිපත් කළ හැකි බව ඉහත සඳහන් කෙරිණි. ඒ අනුව තාක්ෂණික වාර්තා, ජනප්‍රිය වාර්තා, ලිපි සහ ශාස්ත්‍රීය නිබන්ධ ආදී ක්‍රම කිහිපයක් පර්යේෂණ ක්‍රම විද්‍යාව පිළිබඳව විශේෂඥතාවක් දක්වන්නන් විසින් පෙන්වා දී ඇත. තාක්ෂණික වාර්තා හා ජනප්‍රිය වාර්තා මේ අතරින් වඩාත් ප්‍රකට වාර්තා ද්වයක් වශයෙන් සැලකේ. තාක්ෂණික වාර්තා යොදා ගැනෙන්නේ කිසියම් පර්යේෂණයක ප්‍රතිඵලවල වාර්තාවක් සුරක්ෂිතව තබා ගැනීමට හෝ එය ජනගත කිරීමට අවශ්‍ය වූ අවස්ථාවකදීය. ජනප්‍රිය වාර්තා භාවිත වන්නේ

කිසියම් පර්යේෂණයක ප්‍රතිඵලවල ප්‍රතිපත්තිමය සම්බන්ධයක් ඇති විටය (Kothari, 2004: 351). මෙකී වාර්තාව පිළිබඳව වැඩිදුර විස්තර පහත දැක්වේ.

**තාක්ෂණික වාර්තා (Technical Report)**

තාක්ෂණික පර්යේෂණ වාර්තාවක පර්යේෂණය සඳහා යොදා ගන්නා ලද ක්‍රමවේද, ගොඩනගන ලද අභ්‍යුපගමන සහ පර්යේෂණ ප්‍රතිඵල විස්තරාත්මකව ඇතුළත් විය යුතුය. එසේම පර්යේෂණ සීමා සහ උපස්ථම්භක වු දත්ත ආදිය පිළිබඳ තොරතුරු සඳහන්ව තිබිය යුතුය. තාක්ෂණික පර්යේෂණ වාර්තාවක අන්තර්ගත විය යුතු අංග පිළිබඳව දළ සටහනක් පහත දැක්වේ.

- සංක්ෂේපය - පර්යේෂණයේ ප්‍රධාන සොයාගැනීම් පිළිබඳව කෙටි විමර්ශනයක්
- පර්යේෂණයේ ස්වභාවය- අධ්‍යයන අරමුණු ගැටලුව උපන්‍යාස ආදිය පිළිබඳව විස්තර
- ක්‍රමවේදය- පර්යේෂණය සඳහා යොදා ගන්නා ලද සුවිශේෂී ක්‍රමවේද සීමා ආදිය
- දත්ත රැස්කිරීම - දත්ත රැස් කරන ලද ආකාරය ඉතා විස්තරාත්මකව සඳහන්ව තිබීම
- දත්ත විශ්ලේෂණය, අර්ථකථනය සහ ප්‍රතිඵල - දත්ත විශ්ලේෂණය කරන ලද ආකාරය හා ඒවායෙහි අර්ථකථන, ප්‍රතිඵල පිළිබඳව තොරතුරු
- නිගමනය - පර්යේෂණයේ ප්‍රතිඵල ආශ්‍රයෙන් පැමිණි නිගමන සඳහන්ව තිබීම
- ග්‍රන්ථනාමාවලිය- උපයෝගී කර ගන්නා ලද විවිධ මූලාශ්‍රය දැක්වීම
- තාක්ෂණික උපග්‍රන්ථ- ප්‍රධාන වාර්තාවට ආධාර වන ප්‍රශ්නාවලි, සිතියම් ආදී අතිරේක තොරතුරු ඇතුළත් කිරීම සහ ඇමිණීම කළ යුතුය
- සූචිය - වාර්තාවේ සඳහන් මුඛ්‍ය පද සඳහා අනුක්‍රමිකාවක් සකස් කිරීම (මෙය වාර්තාවේ වැදගත් වචන කුමන ස්ථානවල තිබේද යන්න පහසුවෙන් හඳුනා ගැනීම සඳහා උපකාර වේ) (Kothari, 2004: 351-352).

ඉහත දක්වා ඇත්තේ තාක්ෂණික පර්යේෂණ වාර්තාවක ස්වභාවය පිළිබඳව දළ අනුපිළිවෙළක් පමණි. සෑම තාක්ෂණික පර්යේෂණ වාර්තාවක්ම මෙහි සඳහන් අනුපිළිවෙළටම ඉදිරිපත් නොවිය හැකිය. විශේෂයෙන්ම මෙහි එන ඇතැම් ඒකක පවා සමාන නොවන අවස්ථා ද ඇත.

## ජනප්‍රිය වාර්තා (Popular Report)

ජනප්‍රිය පර්යේෂණ වාර්තා සාමාන්‍යයෙන් සරල සහ ආකර්ෂණීය වේ. පැහැදිලි ලෙස ලිවීම, තාක්ෂණික හා ගණිතමය විස්තර අවම කිරීම, ප්‍රස්තාර හා රූප සටහන් අවම කිරීම ආදිය මගින් සරල කළ හැකිය. ආකර්ෂණීය සැලසුම, විශාල ප්‍රමාණයේ මුද්‍රිත පිටපත, අනුමාතෘකා බොහෝ ප්‍රමාණයක් යෙදීම ආදිය ජනප්‍රිය පර්යේෂණ වාර්තාවක තවත් සුවිශේෂී ලක්ෂණ කිහිපයකි. ප්‍රායෝගික පැතිකඩ කෙරෙහි අවධානය යොමු කිරීම සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම මෙවැනි පර්යේෂණ වාර්තාවක ප්‍රධාන අරමුණයි. ජනප්‍රිය පර්යේෂණ වාර්තාවක දළ අනුපිළිවෙළක් පහත දැක්වේ.

- ප්‍රතිඵල සහ ක්‍රියා මාර්ග - ප්‍රතිඵලවල ප්‍රායෝගික වැදගත්කම සහ ඒවායෙහි ක්‍රියාමාර්ග
- ක්‍රියාකාරකම් නිර්දේශ කිරීම - ප්‍රතිඵල මත පදනම්ව ක්‍රියාකාරකම් නිර්දේශ කිරීම
- අධ්‍යයන අරමුණු - පර්යේෂණ ගැටලුව පැන නැගුණු ආකාරය සහ අරමුණු ඉදිරිපත් කිරීම
- යොදා ගන්නා ලද ක්‍රමවේද - භාවිත කරන ලද ක්‍රමවේද සහ ක්‍රම ශිල්ප පිළිබඳව තාක්ෂණික නොවන කෙටි විස්තරයක් සමග දත්ත රැස්කර ගන්නා ලද ආකාරය සඳහන්ව තිබිය යුතු වීම
- ප්‍රතිඵල - අධ්‍යයනයේ ප්‍රතිඵල තාක්ෂණික නොවන පාරිභාෂිතයන් යොදාගෙන පැහැදිලි ලෙස ප්‍රස්තාර, වගු සහ රූප සටහන් මාර්ග යෙන් ඉදිරිපත් කළ හැකිය
- තාක්ෂණික උපග්‍රන්ථ - වාර්තාවට ආධාර වන විස්තරාත්මක තොරතුරු (දීර්ඝ ගණිතමය ව්‍යුත්පත්ති හෝ ගණනයන්, වගු ආදිය) ඇතුළත් විය යුතුය. එහෙත් සම්පූර්ණයෙන්ම පාහේ

පොදු ජනතාව ඉලක්ක කොට ගෙන වාර්තාව සකස් වන්නේ නම් එවැනි විස්තර සංක්ෂිප්ත විය යුතුය (Kothari, 2004: 352-353).

ඉහත විස්තර කරනු ලැබුවේ පර්යේෂණ ක්‍රමවිද්‍යාවේ දක්නට ලැබෙන පර්යේෂණ වාර්තා වර්ග දෙකක දළ සැකැස්මකි. ඒවායෙහි පර්යේෂණ වාර්තාවක අන්තර්ගත විය යුතු සියලු අංග විස්තරාත්මකව සඳහන් නොවේ. එබැවින් පොදුවේ පර්යේෂණ වාර්තාවක අන්තර්ගත විය යුතු සියලු අංග සහ කොටස් විස්තරාත්මකව පහත දැක්වේ.

**පර්යේෂණ වාර්තාවක් ලිවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු**

පර්යේෂණ වාර්තාවක් යනු පාඨකයාට පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳව සන්නිවේදනය කරනු ලබන මාධ්‍යයකි. ඉතා ගුණාත්මක පර්යේෂණයක් මගින් එම කාර්යය ඉතා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සිදු කරනු ලබයි. එබැවින් පර්යේෂණ වාර්තාවක් ලිවීමේදී පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

- වාර්තාවක ප්‍රමාණය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. එහිදී අදාළ විෂය ක්ෂේත්‍රය ආවරණය වන පරිදි සකස් විය යුතු වන අතර පාඨකයා තුළ රුචිකත්වය පවත්වා ගැනීම සඳහා කෙටි ද විය යුතුය.
- පර්යේෂණ වාර්තාවක් නීරස නොවිය යුතුය. එය පාඨකයාගේ කැමැත්ත රඳවා ගැනීමට සමත් විය යුතුය.
- සංක්ෂේපය ලිවීම සඳහා භාවිත කරනු ලබන පාරිභාෂිකයන් ගෙන් සහ දුරවබෝධ තාක්ෂණික භාවිතයන්ගෙන් වැළකිය යුතුය. වාර්තාව හැකිතාක් සරල ආකාරයෙන් පර්යේෂණ ගැටලුව රැගෙන යාමට සමත් විය යුතුය.
- සාමාන්‍යයෙන් පාඨකයා පර්යේෂණයේ මුඛ්‍ය ප්‍රතිඵල පිළිබඳව වහා දැනුම ලබාගැනීම සඳහා වඩාත් උනන්දු වේ. එබැවින් ප්‍රතිඵල පහසුවෙන් ග්‍රහණය කරගත හැකි වන පරිදි ඉදිරිපත් විය යුතුය. මේ සඳහා ප්‍රස්තාර, වගු හා රූප සටහන් යොදා ගත හැකිය (Kothari, 2004: 358).

- වාර්තාවේ සැලැස්ම මනාව සකස් විය යුතුය. එසේ ම පර්යේෂණ අරමුණු සහ ගැටලුවට අදාළ විය යුතුය
- වාර්තාව ව්‍යාකරණ දෝෂවලින් තොර විය යුතුය. උද්ධෘත භාවිතය, පාදක සටහන්, ප්‍රලේඛනය, නිවැරදිව විරාම ලක්ෂණ තැබීම හා පාදක සටහන් සංක්ෂේපය වැනි ක්‍රමශිල්ප ඉතා නිවැරදිව යොදා ගත යුතුය (Neuman, 2014:520)
- වාර්තාව අධ්‍යයන ගැටලුව පිළිබඳ තාර්කික විශ්ලේෂණ ස්වරූපයෙන් ඉදිරිපත් විය යුතුය
- වාර්තාව මූලිකවම සහ අවශ්‍යයෙන්ම බුද්ධිමය ගැටලුවලට විසඳුම් ලබාදීම සඳහා ගනු ලබන ව්‍යායාමයක් බව විද්‍යමාන ද විය යුතුය. එසේ ම ගැටලුවකට විසඳුමක් ලබාදීම සඳහා දායක විය යුතු වන අතර විශ්වීය දැනුම් ගබඩාවට ඇතුළත් විය යුතුය.
- පර්යේෂණ වාර්තාව මගින් ගැටලුවට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම ප්‍රකාශ විය යුතුය
- එම විෂය ක්ෂේත්‍රයට අදාළ අනාගත පුරෝකථන වාර්තාව මගින් ඉදිරිපත් වේ නම් එය සාමාන්‍යයෙන් ගුණාත්මක පර්යේෂණයක් වශයෙන් සැලකේ. එසේම එම සුවිශේෂී ක්ෂේත්‍රයට අදාළව තවදුරටත් සිදුකළ යුතු පර්යේෂණ පිළිබඳව සඳහන් විය යුතුය
- වාර්තාවේ තාක්ෂණික තොරතුරුවලට අදාළ සියලුම උපග්‍රන්ථ නිමකරණය කළ යුතුය
- යොදා ගන්නා ලද මූලාශ්‍රය පිළිබඳව ග්‍රන්ථ නාමාවලිය අවශ්‍යයෙන් ම ඇතුළත් විය යුතුය
- සූචිකරණය ගුණාත්මක පර්යේෂණ වාර්තාවක අත්‍යවශ්‍ය අංගයකි. එබැවින් එය සකස් කොට අගට ඇමිණිය යුතුය
- වාර්තාව ආකර්ෂණීය නිමැවුමකින් සහ පැහැදිලිව තිබිය යුතුය
- රහස්‍යභාවයේ සීමා හා පර්යේෂණය සිදුකරගෙන යෑමේ දී පැන නැගුණු ප්‍රතිවිරෝධ වාර්තාව තුළ පැහැදිලිව දැක්විය යුතුය
- පර්යේෂණයේ අරමුණු, ගැටලුවේ ස්වභාවය, යොදා ගන්නා ලද ක්‍රමවේදය හා විශ්ලේෂණ ක්‍රම ශිල්ප ආදිය හැඳින්වීම යටතේ ආරම්භයේදීම සඳහන් කළ යුතුය (Kothari, 2004: 359).
- රචනා චෞරත්වයෙන් (Plagiarism) වැළකිය යුතුය. එනම්,

වෙනත් අයෙකුගේ මුල් නිර්මාණයක් ඔහුගේ අවසරයකින් හෝ ඔහු පිළිබඳ ඇගයීමකින් තොරව ලබාගැනීමයි. එය බරපතල ශාස්ත්‍රීය වරදක් වශයෙන් සැලකේ (Jain, 2005: 291).

**පර්යේෂණ වාර්තාවක අංශ (Divisions) සහ කොටස් (Sections)**

නිම කරන ලද පර්යේෂණවල සැකැස්ම පිළිබඳ ව අධ්‍යයනය කොට ටුරාබියන් විසින් පර්යේෂණ වාර්තාවක ව්‍යුහය සකස් විය යුතු ආකාරය පිළිබඳව දළ සටහනක් ඉදිරිපත් කොට තිබේ. (සේනාධිර වනසිංහ 2013: 196) ඒ අනුව පර්යේෂණ වාර්තාවක් ප්‍රාථමික, ප්‍රධාන හා අතිරේක යන මූලික අංශ තුනකින් සහ අනු කොටස් රාශියකින් යුක්ත වේ.

**ප්‍රාථමික අංශය**

ප්‍රාථමික අංශය යනු පර්යේෂණ වාර්තාවක මූලිකවම තිබිය යුතු මාතෘකා පිටුව, සංක්ෂේපය, පර්යේෂකයාගේ ප්‍රකාශය, පෙරවදන, ස්තුතිය, පටුන, වගු නාමාවලිය, රූපසටහන් නාමාවලිය සහ කෙටි යෙදුම් යන කොටස්වල එකතුවයි. මෙම කොටස් ඇතුළත් පිටු රෝම ඉලක්කම් යටතේ අංකනය කළ යුතුය. සාමාන්‍යයෙන් මේ සඳහා පිටු පහත් දහයත් අතර ප්‍රමාණයක් යොදා ගැනීම යෝග්‍ය වේ. මෙහි දළ අනුපිළිවෙල ඉහත සඳහන් පරිදිම යොදා ගැනීම සුදුසු වුවත් ඇතැම් විශ්වවිද්‍යාලය සහ පර්යේෂණ සඳහා අනුග්‍රහය දක්වන ආයතන හෝ සංවිධාන මගින් ඉදිරිපත් කරනු ලබන නිර්ණායකයන්ට අනුව එය වෙනස් විය හැකිය.

**ප්‍රධාන අංශය**

පර්යේෂණ වාර්තාවේ සාරවත් සහ වැදගත්ම අංශය වන මෙය පර්යේෂණයේ ප්‍රතිඵල පාඨකයා වෙත රැගෙන යමින් එහි මූලික අරමුණු සාධනය කරයි. පර්යේෂණ වාර්තාවේ (95%) වැඩි කොටසක් මෙම අංශය මගින් නියෝජනය වේ. මේ යටතට ඇතුළත් හැඳින්වීම, සාහිත්‍ය විමර්ශනය, ක්‍රමවේදය ප්‍රතිඵල, සාකච්ඡාව හා නිගමනය යන ප්‍රධාන අංග පරිච්ඡේද ආකාරයෙන් දැක්විය යුතුය. සාමාන්‍යයෙන්

පරිච්ඡේද හතරත් හයත් අතර ප්‍රමාණයක් යොදා ගැනීම සුදුසු ය. හැඳින්වීම සහ සාහිත්‍ය විමර්ශනය යන අංග පරිච්ඡේද දෙකක් හෝ එක් පරිච්ඡේදයක් ලෙස සකස් කර ගත හැකිය. ඇතැම් විට පර්යේෂණ යෝජනාවලිය පළමු පරිච්ඡේදය ලෙස යොදාගෙන ඇති අවස්ථාව ද දැකිය හැකිය.

**අතිරේක අංශය**

මෙම අංශය පර්යේෂණ සඳහා යොදා ගන්නා ලද විවිධ මූලාශ්‍රය, ඇමුණුම්, උද්ධෘත ආදියෙන් සමන්විත වේ. ඊට අමතරව පර්යේෂණයේ අන්තර්ගත පාරිභාෂික සහ ඒවාගෙන් නියෝජනය වන වැදගත් සංකල්ප පහසුවෙන් සොයා ගැනීම සඳහා උපකාර වන සූචිය දැක්වීම ද මෙහිදී සිදු කෙරේ. පාදක හෝ ආන්තික සටහන් භාවිතය ද මේ අංශයට ඇතුළත් කළ හැකිය (Turabian, 1952: 7).

**පර්යේෂණ වාර්තාවක ප්‍රාථමික අංශය මාතෘකා පිටුව**

මේ සඳහා පිටු දෙකක් වෙන් කෙරේ. පළමු පිටුවේ අදාළ අධ්‍යයන මාතෘකාව, ඉදිරිපත් කරනු ලබන උපාධිය, විශ්වවිද්‍යාලය හෝ ආයතනයේ නම, පර්යේෂකයාගේ නම, සුදුසුකම් හා වර්ෂය සඳහන් කළ යුතු වේ. දෙවැනි පිටුවේ මධ්‍යයට ඉහළින් මාතෘකාව පමණක් සඳහන් කරනු ලැබේ.

**සංක්ෂිප්තය**

සමස්ත පර්යේෂණය පිළිබඳ සාරාංශයක් ඉතාම කෙටියෙන් ඉදිරිපත් කිරීම අවශ්‍යය. ඇමරිකානු මනෝවිද්‍යාඥයන්ගේ සංගමයේ මූලාශ්‍රය දැක්වීමේ ශෛලිය අනුව (APA Style) සාරාංශයක් වචන 150-250 අතර විය යුතුය. කෙසේ නමුත් එය සඟරා වර්ගය අනුව වෙනස් විය හැකිය. එහිදී අධ්‍යයන ගැටලුව, අරමුණු, ක්‍රමවේදය හා අනාවරණ පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම කළ යුතුය. සාරාංශය කියවීමෙන් සමස්ත අධ්‍යයනය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි විය යුතුය.

**පර්යේෂකයාගේ ප්‍රකාශය**

උපාධියක් සඳහා ඉදිරිපත් කරනු ලබන වාර්තාවක අත්‍යවශ්‍ය අංගයකි. එම වාර්තාව තමාගේ ස්වයං අධ්‍යයනයක් බව සහතික කිරීමක් මෙහිදී සිදු වේ. බොහෝවිට අදාළ විශ්වවිද්‍යාලය / ආයතනය මගින් මෙම ප්‍රකාශය ලබාදීම කරනු ලබයි.

**ස්තුතිය**

අධ්‍යයන කාර්යය සඳහා සහයෝගය ලබාදුන් පුද්ගලයන්ට සහ ආයතනවලට ස්තුතිය පිරිනැමීම මෙහිදී සිදු කරනු ලබයි. මෙය ඉතා කෙටියෙන් සිදු කිරීම සාමාන්‍ය ක්‍රමවේදයයි. ඒ සඳහා පිටුවක් යොදා ගැනීම ප්‍රමාණවත් වේ.

**පටුන**

පර්යේෂණ වාර්තාවක පටුන පරිච්ඡේද අනුව මාතෘකා හා අනුමාතෘකා යටතේ විස්තරාත්මකව සිදුකළ හැකිය.

නිදසුන්:

1. පරිච්ඡේදය - සමීක්ෂණ
1.0 හැඳින්වීම
1.1 සමීක්ෂණය යනු කුමක්ද?
1.2 සමීක්ෂණ වර්ග
1.2.1 කණ්ඩායම අනුව සමීක්ෂණ වර්ග කිරීම
1.2.1.1 ජනගහන සමීක්ෂණ
1.2.1.2 නියැදි සමීක්ෂණ

**වගු නාමාවලිය**

සෑම වගුවක් ම අංකනය කිරීම අවශ්‍ය වේ. එය පරිච්ඡේද අනුව හෝ අනුපිළිවෙළින් හෝ කළ හැකිය. පරිච්ඡේද අනුව කිරීමෙන් සංස්කරණයට පහසු වේ.

නිදසුන්:

1.1 වගුව -සිසුන්ගේ ප්‍රතිචාර

1.2 වගුව- ගුරුකේන්ද්‍රීය අධ්‍යාපනයේ දුර්වලතා

### රූප සටහන් නාමාවලිය

ඉහත වගු නාමාවලිය සකස් කළ ආකාරයටම රූපසටහන් ද අංකනය කර ලැයිස්තුවක් ලෙස වෙනම පිටුවකින් ඉදිරිපත් කළ යුතුය.

### ඇමුණුම් නාමාවලිය

වාර්තා තුළ අන්තර්ගත කළ නොහැකි විශාල ප්‍රමාණයේ චක්‍රලේඛ, සිතියම් වැනි දෑ ඇමුණුම් ලෙස වාර්තාව අවසානයට එකතු කළ හැකිය. එවැනි ඇමුණුම් ද ඉහත නාමාවලිය ආකාරයටම ලැයිස්තුවක් ලෙස දැක්වීම අත්‍යවශ්‍ය වේ (සේනාධීර හා වනසිංහ, 2013: 197-199).

නිදසුන්:

| ඇමුණුම් | පිටු |
|---|---|
| ප්‍රශ්නාවලිය | 65 |
| විස්තරාත්මක දත්ත | 70 |

### කෙටි යෙදුම් (Abbreviation)

වාර්තාවේ එන දීර්ඝ වචන හා වාක්‍ය ඛණ්ඩ (ආයතන, සංවිධාන, න්‍යායන්) සඳහා කෙටි යෙදුම් භාවිත කොට ඒවායෙහි සම්පූර්ණ අර්ථය දැක්වීම මෙහිදී සිදු කෙරේ.

නිදසුන්:

ද.ආ.ප.පු.ආ - දකුණු ආසියානු පර්යේෂණ හා පුහුණු ආයතන
පා.පො.ස - පාලි පොත් සමාගම

## පර්යේෂණ වාර්තාවක ප්‍රධාන අංශය

### හැඳින්වීම

පර්යේෂණය සිදු කරන්නේ කුමක් සඳහා ද යන්න පාඨකයාට ඒත්තු ගන්වන්නේ හැඳින්වීමෙනි එහිදී පර්යේෂණයට අදාළ පසුබිම් තොරතුරු ඉදිරිපත් වේ. ඒ අනුව පර්යේෂණ මාතෘකාව ප්‍රකාශ කිරීම, අරමුණු දැක්වීම, වැදගත්කම පෙන්වාදීම, පර්යේෂණ ගැටලුව, උපන්‍යාස ආදිය පෙන්වා දීම සහ පර්යේෂණ ව්‍යුහය කෙටියෙන් දැක්වීම සිදු කළ යුතුය (කෙටි පර්යේෂණ වාර්තාවකදී අත්‍යවශ්‍ය නොවේ) (Kothari, 2004: 349).

### සාහිත්‍ය විමර්ශනය

තෝරාගන්නා ලද මාතෘකා පිළිබඳව ලිඛිත හා අනෙකුත් මූලාශ්‍රය පිළිබඳව දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම සාහිත්‍ය විමර්ශනය යටතේ සිදු කෙරේ. පර්යේෂණ ගැටලුව හා උපන්‍යාසයන්ට අදාළ ආනුභවික හා න්‍යායාත්මක යන අංශ දෙක යටතේ දේශීය හා විදේශීය වශයෙන් සිදු කරන ලද පර්යේෂණ හා ඒවායෙහි සොයාගැනීම්, දායකත්වයන්, ක්‍රමවේද, දුර්වලතා හා සුවිශේෂීතා තර්කානුකූලව පෙන්වාදීම සිදු කළ යුතුය (සේනාධීර හා වනසිංහ, 2013: 200). තෝරාගන්නා ලද පර්යේෂණ මාතෘකාවට එකී පර්යේෂණයන්ගේ අදාළත්වය පෙන්වාදිය යුතුය. සෑම මූලාශ්‍රයක් පිළිබඳවම විස්තරයක්, සමාලෝචනයක් හා ඇගයීමක් අන්තර්ගත විය යුතුය.

### ක්‍රමවේදය

පර්යේෂණ ගැටලුව විමර්ශනය කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග එනම් ක්‍රමවේද, නියැදිය, දත්ත රැස් කිරීමේ ක්‍රම හා උපකරණ ආදිය මෙහිදී විස්තර වේ. අදාළ ගැටලුව විමර්ශනය කිරීම සඳහා උපයෝගි කරගන්නා ලද තොරතුරු හඳුනා ගැනීමට, තෝරා ගැනීමට, සැකසීමට හා විශ්ලේෂණය කිරීමට එහි භාවිත ක්‍රමවේදයන්ගේ යුක්ති සහගත බව මෙහිදී පෙන්වා දිය යුතුය. (Use librariesre search guide n.d) ප්‍රායෝගික නොවන සහ නොගැළපෙන ක්‍රමවේදයන් යොදා ගැනීමෙනි. පර්යේෂණයේ වලංගුතාව සහ විශ්වසනීයත්වය බිඳ වැටේ.

## දත්ත විශ්ලේෂණය හා ප්‍රතිඵල

රැස් කරගන්නා ලද දත්ත ක්‍රමවේදයේදී යෝජනා කරන ලද ආකාරයට ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කළ හැකිය. ප්‍රමාණාත්මකව රැස් කර ගන්නා ලද දත්ත විශ්ලේෂණය කරනු ලබන්නේ සම්මත සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමවේද උපයෝගී කොටගෙනය. මේ සඳහා එස්.පී.එස්.එස් (SPSS) වැනි පරිගණක මෘදුකාංග භාවිත කළ හැකිය. කිසියම් පර්යේෂණයක ප්‍රතිඵල යනු දත්ත විශ්ලේෂණය කිරීම මගින් සොයා ගන්නා ලද දේවල්ය. එවැනි ප්‍රතිඵල ඉදිරිපත් කිරීමේදී සුදුසු පරිදි වගු, ප්‍රස්තාර හා රූප සටහන් ආදිය යොදා ගත හැකිය.

## නිගමන, සාකච්ඡා හා යෝජනා

අධ්‍යයන ප්‍රතිඵල අර්ථකථනය කිරීම සහ ඒවා පර්යේෂණ සාහිත්‍යයේ පෙර පර්යේෂණ ප්‍රතිඵල සමඟ සම්බන්ධ වන ආකාරය සාකච්ඡාව මගින් ඉදිරිපත් විය යුතුය. අධ්‍යයන ප්‍රතිඵල අර්ථකථනය කිරීම මගින් පැමිණි නිගමනයන් තාර්කිකව සහ සහේතුකව ඉදිරිපත් කළ යුතුය. ගැටලුවේ සංවර්ධනය සඳහා ඉවහල් වන යෝජනා ඉදිරිපත් කිරීම පර්යේෂණ වාර්තාවක වැදගත් අංශයකි (සේනාධීර හා වනසිංහ, 2013 : 201). පර්යේෂණයක් අවශ්‍යයෙන්ම කිසියම් සන්දර්භයකට සීමා වූ සුවිශේෂී කාර්යයකි. එබැවින් ගැටලුවට අදාළ සෑම පැතිකඩක්ම එක් කාර්යයකින් ආවරණය කළ නොහැකිය. ඇතැම් විට එකම පර්යේෂණය වුවද විවිධ පසුතල යටතේ නැවත නැවත සිදු කිරීමට සිදුවන අවස්ථා ඇත. එබැවින් අදාළ පර්යේෂණ ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය සුදුසු යෝජනා ඉදිරිපත් කළ යුතුය.

## පර්යේෂණ සීමා

පර්යේෂණ සීමා යනු කිසියම් පර්යේෂණයක් එක් සුවිශේෂී ක්ෂේත්‍රයකට දිශාගත කිරීමේදී ඇතිවන සීමාය. තෝරාගත් ගැටලුවක් පිළිබඳව පුළුල්ව සහ ගැඹුරින් අධ්‍යයනය කිරීම පර්යේෂණයක ප්‍රධාන කාර්යයකි. එකී කාර්යය සඳහා පළමුව පර්යේෂණයේදී පිළිතුරු සපයන්නේ කුමන ගැටලුවලට ද යන්න හඳුනාගත යුතුය. පර්යේෂණ

යෝජනා ඉදිරිපත් කිරීමේදී පර්යේෂණ සීමාවන් මත පදනම් වේ.

**පර්යේෂණ වාර්තාවක අතිරේක අංශය ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

කිසියම් පර්යේෂණයක් සිදු කිරීම සඳහා ආධාර කරගත් මූලාශ්‍රය දැක්වීම එහි විද්‍යාත්මක බව සහ විශ්වසනීයත්වය පවත්වා ගැනීමට ඉවහල් වේ. සමස්ත පර්යේෂණ ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා ලද ලේඛන (පොත්, සඟරා, වාර්තා, නිබන්ධ ආදිය) සහ වෙබ් අඩවි, හඬපට සහ සම්පත්දායකයන් ආදී සියල්ලක්ම දැක්විය යුතුය. කර්තෘවරයාගේ පෙළපත් නාමය අනුව අකාරාදී පිළිවෙළට මෙම නාමාවලිය සැකසිය යුතුය (Jain, 2005: 291). එහිදී මූලාශ්‍රය භාවිත කරනු ලබන සම්මත ක්‍රමවේදයන් (APA, Harvard, Chicargo) යොදාගත යුතුය.

**පාදක සටහන් හා ආන්තික සටහන් භාවිතය**

අදාළ විශ්වවිද්‍යාලය/ආයතනය නිර්දේශ කරන ආකාරයට සුදුසු පරිදි පාදක සටහන් හෝ ආන්තික සටහන් භාවිත කළ හැකිය. මෙම දෙකෙහි ආකෘතියේ වෙනසක් නොවුණ ද යොදන ස්ථානය වෙනස් වේ. එනම් පාදක සටහන් යොදනුයේ පිටුවක පහළ (අවසාන) කොටසෙහිය. ආන්තික සටහන් ඊට වෙනස්ව කිසියම් ලේඛනයක අවසානයේ යොදනු ලැබේ.

**උද්ධෘත පාඨ දැක්වීම**

උද්ධෘත කතුවරයාගේ ප්‍රකාශයක් ලෙස හෝ පර්යේෂකයාගේ පරිවර්තනයක් ලෙස දැක්විය හැකිය. එහිදී පිළිවෙළින් කතුවරයා, වර්ෂය හා පිටු අංකය සඳහන් කළ යුතුය.

**සමාලෝචනය**

පර්යේෂණ වාර්තාවක් අවශ්‍යයෙන්ම තාර්කික, විචාරාත්මක විවේචනාත්මක හා විමර්ශනාත්මක විය යුතුය. සමාජවිද්‍යා, මානව ශාස්ත්‍ර, කළමනාකරණ හා ව්‍යාපාර අධ්‍යයනය වැනි විෂයන්හිදී මෙම ලක්ෂණ දක්නට ලැබුණ ද ජීවවිද්‍යාව, රසායන විද්‍යාව වැනි ශුද්ධ විද්‍යාවන්හි සෛද්ධාන්තික, ගණිතමය හා ප්‍රායෝගික භාවිතයන් නිසා

ඒවා බොහෝවිට ආනුභවික ලක්ෂණවලින් යුක්ත වේ. ඉහතින් විස්තර කරනු ලැබූ පර්යේෂණ වාර්තා සකස් කිරීම පිළිබඳව නිර්ණායක උපදෙස් සහ අනුපිළිවෙළ වැඩිපුරම අදාළ වන්නේ සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර වැනි විෂයන්හි පර්යේෂණ වාර්තාවන්ටය. කෙසේ නමුත් ශුද්ධ විද්‍යාවන්හි මෙහි සඳහන් ලක්ෂණ කිසිවක් නොකියවෙන බවත් එයින් ගම්‍ය නොවේ. ඒ අනුව මෙහිදී පර්යේෂණ වාර්තාවක ස්වභාවය කුමක්ද? එහි ලක්ෂණ මොනවාද? ඒ පිළිබඳව උගතුන් ලබාදී ඇති නිර්වචන මොනවාද? සහ පර්යේෂණ වාර්තාවක අනුපිළිවෙළ කෙසේ සකස් විය යුතුද? යන්න පිළිබඳවත්, පර්යේෂණ වාර්තාවක් සකස් කිරීමේදී අනුගමනය කළයුතු උපදෙස් මොනවාද? යන්න පිළිබඳවත් සඳහන් විය. එසේම විවිධ පර්යේෂණ වාර්තාවන්වලදී අනුපිළිවෙළ වෙනස් වන ආකාරයත්, පොදුවේ පර්යේෂණ වාර්තාවක තිබිය යුතු අංග පිළිබඳවත් විස්තරාත්මකව සාකච්ඡා කරන ලදි. ඒ අනුව මෙම ලිපිය මගින් පර්යේෂණ වාර්තාවක් සකස් කරන ආකාරය පිළිබඳව ප්‍රාමාණික අවබෝධයක් ලබා ගත හැකිය.

### ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

විජේරත්න, ආර් (1996) **පර්යේෂණ ප්‍රතිඵල වාර්තා කිරීම** (සංස්) අධ්‍යාපන පර්යේෂණ දෙපාර්තමේන්තුව, පර්යේෂණ සඳහා යොමු කිරීමක්, මහරගම : ජාතික අධ්‍යාපන ආයතනය.

සේනාධීර, එස්. සහ වනසිංහ, එස්. (2013) **පර්යේෂණ ක්‍රමවේදය.** කොළඹ 10: ගොඩගේ සහ සහෝදරයෝ.

Chimoriya,B,**Research Report: Meaning/Definition, Purpose, Types, Procedure**, retrieved 2019-07-11 fromhttps://www.wisenepali.com/2017/03/research-report-meaningdefinition.html.

Concordia, **How to Write a Literature Review**, retrieved from 2019-07-13https://library.concordia.ca/help/writing/literature-review.php

Jain, M.K. (2005) **Research Methodology and Statistical Evaluation**. New Delhi: Shree Publisher and Distributors.

Krishnaswami, O.R., Ranganatham, M., Harikumar, P.N. (2016). **Research Methodology**. Mumbai: Himalaya Publishing House.

Kothari, C.R. (2004) **Research Methodology - Methods and Techniques**. New Delhi: New age international publishers.

Neuman, W.L. (2014) **Social Research Methods: Qualitative and QuantitativeApproache**s. Edinburgh Gate: Pearson Education Limited.

Turabian, K.L. (1952) **A Manual for Writers of Dissertations**, Illinois: The University of Chicago Press.

USC Libraries, **Research Guides**, retrieved from 2019-07-13https:// libguides.usc.edu/writingguide/methodology.

Very well mind, How to write an APA abstract, retrieved 2019-07-13 www.verywellmind.com/how-to-write-an-abstract-2794 845 Wikipedia, report, retrieved 2019-07-11 from https:// en.wikipedia.org/wiki/Report.